Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## වකුෆ් විනිශ්චයාධිකාරයට සභාපති හා සාමාජිකයින් පත් කිරීම - 2022

1982 අංක 33 දරන පනතින් සංශෝධිත 1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි සහ පුණ්‍ය භාර හෝ වකුෆ් පනත යටතේ වකුෆ් විනිශ්චයාධිකාරයට සභාපති හා සාමාජිකයන් පත් කිරීම සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

02. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන මුස්ලිම්වරුන් විය යුතුය.

03. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වකුෆ් විනිශ්චයාධිකාරය" යනුවෙන් සඳහන් කොට **2022 නොවැම්බර් මස 04** වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

04. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටින විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය
(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය
(ඈ) සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

05. රජයේ/සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් සහ ඊට අදාල වෙනත් ලිපි සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා වෙත ආමන්ත්‍රණය කළ යුතුය.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

*වකුෆ් විනිශ්චයාධිකාරයට පත්කිරීම සඳහා වන ආදර්ශ අයදුම් පත*

---

දිස්ත්‍රික්කය :

1. මුලකුරු සමග නම :

උදා. : අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උදා. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :